www.xtrapapers.com



## Section B – Reading Comprehension

Do **not** translate the passage below. First read it carefully and then answer, briefly and in **Sinhala**, the questions that follow.

ඍතුවේ පළමු වැසි පටන් ගෙන තිබිණි. පදිකයින්ට හා වාහන ගමනාගමනයට මාර්ග වැඩි වැඩියෙන් අනතුරුදායක වෙමින් තිබිණ. ශීත ඍතුවේ වියළි මාස කීපයේ දී සහෝදරයෝ සාමාන්‍යයෙන් බයිසිකලයෙන් පාසලට යති. එහෙත් වැසි සමයේ දී පාරවල වතුර බැස නොයාම නිසා ගැටි හා වලවල් දැකීම අපහසු වෙයි. පොත් පිර වූ බෑග් පිටේ එල්ලාගෙන ඔවුන් පාසැල් යද්දී, කලින් සිදු වූ හදිසි අනතුරුවලින් ඉතිරි වූ, පොත්වලින් ගැලවී ඉරී ගිය පිටු හා මලුවලින් ඉවත විසිවුණු එලවලු හා පලතුරු වැනි දේ ඔවුන්ට පාර දෙපස දක්නට ලැබුණි.

පොත්වල කොටස් හා පලතුරු දුටු සහෝදරයෝ දෙදෙනා සිනාසුණහ. මාර්ග මේ තරම් නරක තත්වයක තිබිය දී මිනිසුන් බයිසිකල් එළියට ගන්නේ මන්දැයි ඔව්හු කල්පනා කළහ. තමන් කලින් දැන සිටි වලවල් මග හරිමින් බස් රියැදුරෝ හෙමින් වාහන පැදවූහ. බස්වල සිටි සමහර මිතුරෝ ඔවුන් පසුකර යද්දී ඔවුන්ට අත් වැනූහ. පදික මං තීරුව අද්දර වූ ගල් මග හරිමින් පරිස්සමින් සහෝදරයෝ ගමන් කළහ. කාරයක් හෝ බසයක් එන විට ඉන් විහිදෙන වතුරින් බේරීම සඳහා ඔව්හු යළිත් මං තීරුව අද්දරට ගියහ.

පාසලට ළඟා වන විට තමාගේ කුඩා පුතා බයිසිකලයේ නංවාගෙන එන තාත්තා කෙනෙකු ඔව්හු දුටුවෝය. කුඩා ළමයාගේ පිටේ පාසැල් බෑගය එල්ලී තිබුණ අතර ඔහු ඉදිරි පසින් දිවා ආහාර පෙට්ටිය විය. සහෝදරයෝ යළිත් සිනාසෙමින් ඔහුට ඉඩ දීමට දෙපසට වෙමින් බයිසිකලය ඔවුන් දෙසට එනු බලා සිටියහ. එහෙත් ඔවුන්ට ළං වෙද්දී බයිසිකලය භයානක ලෙස දෙපසට පැද්දී තාත්තාත් පුතාත් බිමට වැටෙන්නට යනු දුටුවෝය. සහෝදරයෝ වහා ඉදිරියට පැන්නාහ. එක් සහෝදරයෙක් බයිසිකලයේ හැඬලයේ දකුණු පැත්තෙන් අල්ලාගෙන එය හෙමින් පහත් වෙන්නට සැලැස්වීය. අනිත් සහෝදරයා කුඩා ළමයාගේ ඇඟට යටින් අතක් දමා ඔහු බිම වැටෙන්නට නොදී බේරා ගත්තේය. තාත්තා බිම වැටුණේය. එහෙත් ඒ සහෝදරයින් දෙදෙනා බයිසිකලය ඇල්ලීමෙන් එය වැටෙන වේගය අඩු නොකළේ නම්, තාත්තාත් පුතාත් ඊට වඩා අනතුරකට භාජනය වන්නට ඉඩ තිබිණි. තෙත් වී මඩ ගෑවුණු, ඉරුණු කලිසම ඇතිව හෙමින් නැගී සිටි ඔහු තමාගේ ඇඳුම්වල තිබූ කුණු පිසදමා කුඩා පුතු හොඳින් දැයි බැලීය. ''අපි පාසැලේ ඉඳලා ගොඩක් දුර ඉන්නෙ. අද නරක කාලගුණය නිසා පාසැල් බසයට අපේ ගේ ළඟින් යන්න බැරිවුණා.'' ඔහු සහෝදරයන් දෙදෙනාට පැහැදිලි කළේය. ''මම සාමාන්‍යයෙන් බයිසිකලයෙන් එන්නෙ නෑ, ඒත් අද පුතාට පාසැලේ නාට්‍ය පුහුණුවක් තිබෙන නිසා මෙහෙම එන්න සිද්ද වුණා. මගේ බයිසිකලය කැඩිලා, දැන් මෙයා ඉස්කෝලෙට ගෙනියන්නේ කොහොම ද කියල මට හිතා ගන්න බෑ.''

සහෝදරයෝ දෙදෙනා එකිනෙකා දෙස බැලූහ. එවිට එක් සහෝදරයෙක් තමා ඔහු සමග බයිසිකලය අලුත් වැඩියා කරන තැනට ගෙන යන්නට එන බව කීවේය. අනිත් සහෝදරයා දරුවා පාසැලට ගෙන යන්නට ඉදිරිපත් විය. කුඩා දරුවා ඔහු දෙස බලා සිනා සී හිස වැනුවේය. එක් සහෝදරයෙක් කෑම පෙට්ටියත් පාසැල් බෑගයත් අතට ගත්තේය. අනෙක් සහෝදරයා දරුවාට අල්ලා ගන්නට සිය අත දික් කළේය. ඉන් පසු ඔවුහු සියලු දෙනා තාත්තාට අත වනමින් ඈතට ඇවිදගෙන ගියහ.

www.xtrapapers.com



Now answer the following questions briefly, using your own words as far as possible.

**3** සහෝදරයින් සාමාන්‍යයෙන් පාසලට ගියේ කෙසේ ද? [1]

**4** පාරවල් වැඩි වැඩියෙන් අනතුරුදායක වුණේ කුමක් නිසා ද? [2]

**5** පාරේ මීට කලින් අනතුරු සිදු වී තිබූ බව සහෝදරයින් දැනගත්තේ කෙසේ ද? [2]

**6** කලින් සිදු වූ අනතුරු ගැන සහෝදරයින් සිනාසුණේ මන්ද? [1]

**7** වැසි සමයේදී බස් ගමන් කළේ කෙසේ ද? [2]

**8** වාහනයක් එනු දුටු විට සහෝදරයින් කළේ කුමක් ද? එයට හේතු කවරේ ද? [2]

**9** අනතුර වඩාත් භයානක වන්නට ඉඩ තිබිණ. එහෙත් සහෝදරයින් එය වැලැක් වූයේ කෙසේ ද? කරුණු තුනක් සඳහන් කරන්න. [3]

**10** කුඩා ළමයා සාමාන්‍යයෙන් පාසල් ගියේ කෙසේ ද? එදා ඔහු එසේ නොගියේ මන්ද? [2]

**11** තාත්තාගේ සිතට කරදර ඇති වූයේ කවර හෙයින්ද? කරුණු තුනක් සඳහන් කරන්න. [3]

**12** තාත්තාගේ ගැටලුව විසඳන්නට සහොදරයින් කළේ කුමක් ද? [2]

Language and spelling [5]

**Total Marks [25]**

© UCLES 2014

